# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2026.01.30 පැය 1135 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 171 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මීරිගම පොලිස් වසමේ මුගුරුගම්පොල අම්බරුක්ඛාරාම විහාරස්ථානයේ සංඝමිත්තා පෙරහර විථි සංචාරය කිරීමට අදාලව ක්‍රියාත්මක රථවාහන සැලැස්ම.**

මීරිගම පොලිස් වසමේ මුගුරුගම්පොල අම්බරුක්ඛාරාම විහාරස්ථානය මඟින් සංවිධානය කරනු ලබන සංඝමිත්තා පෙරහර උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

2026.01.31 වන දින රාත්‍රී 10.30 සිට 2026.02.01 වන දින අළුයම 01.00 දක්වා පෙරහර ගමන් ගන්නා මාර්ගයේ ඇතිවිය හැකි රථවාහන අවහිරතාවය අවම කර ගැනීම සඳහා පෙරහර අවසන් වන තෙක් එම ප්‍රදේශය හරහා ගමන් කරන මහජනතාවගෙන් හා රියැදුරන්ගෙන් පහත සඳහන් මාර්ග හා විකල්ප මාර්ග භාවිත කරන මෙන් පොලිසිය ඉල්ලා සිටී.

**රථවාහන ගමනාගමනය සීමා කරන මාර්ගයන්**

- **නුවර - කොළඹ ප්‍රධාන මාර්ගය පස්යාල හන්දිය මාර්ග බාධකය - නිට්ටඹුව පොලිස් වසම**
- **නුවර - කොළඹ ප්‍රධාන මාර්ගය දංඕවිට මාර්ග බාධකය - දංඕවිට පොලිස් වසම**
- **වේයන්ගොඩ මල්ලැහැව මාර්ගය මල්ලැහැව මාර්ග බාධකය - පල්ලේවෙල පොලිස් වසම**
- **හද්දමුල්ල මාර්ග බාධකය - නාල්ල පොලිස් වසම**
- **දිවුලපිටිය ඔරලෝසු කණුව අසල මාර්ග බාධකය - දිවුලපිටිය පොලිස් වසම**

**විකල්ප මාර්ග**

- ✓ **කොළඹ සිට මීරිගම නගරය හරහා හෝ මීරිගම අධිවේගී මාර්ගය වෙත ගමන් කරන රථවාහන පස්යාල හන්දියෙන් ගොස් දංඕවිට හන්දියෙන් වමට හරවා මීරිගම දංඕවිටට හැරෙන හන්දියෙන් දකුණට හරවා අධිවේගී පිවිසුමට පිවිසිය හැකිය.**

- ✓ පස්යාල මීරිගම අතුරු මාර්ග වලින් පැමිණෙන රථවාහන මීරිගම ඩී.එස්. හන්දියෙන් වේවැල්දෙණිය මාර්ගය හරහා ගොස් දංඕවිට හන්දියෙන් වමට හරවා මීරිගම දංඕවිට හන්දියෙන් දකුණට හැරී අධිවේගී පිවිසුමට පිවිසිය හැකිය.

- ✓ දිවුලපිටිය මාර්ගයෙන් අධිවේගී පිවිසුමට පැමිණෙන වාහන කොළඹ - කුරුණෑගල 05 මාර්ගයෙන් කොටදෙණියාව නාල්ල හරහා හද්දමුල්ල හන්දියෙන් දකුණට හැරී අධිවේගී පිවිසුම දක්වා ගමන් කල හැකිය.

- ✓ දිවුලපිටිය දෙස සිට අතුරු මාර්ග වලින් පැමිණෙන වාහන රේන්දපොල හන්දියෙන් වමට ඇති මීරිගම කොටදෙණියාව මාර්ගයේ කොටදෙණියාව හන්දියට ගොස් දකුණට හරවා කොළඹ කුරුණෑගල 05 මාර්ගයේ හද්දමුල්ල හන්දියෙන් දකුණට හැරී අධිවේගී මාර්ගයට පිවිසිය හැකිය.

- ✓ අධිවේගී මාර්ගයෙන් පිටවන වාහන වමට හරවා හද්දමුල්ල හන්දියෙන් කුරුණෑගල - කොළඹ 05 මාර්ගයේ කොටදෙණියාව හරහා දිවුලපිටිය දෙසට ගමන් කර දිවුලපිටියෙන් කටුනායක අධිවේගි මාර්ගය දක්වා ගමන් කල හැකිය.

- ✓ අධිවේගී මාර්ගයෙන් පිටවන රථවාහන දකුණට හරවා මීරිගම නගරයෙන් දංඕවිටට හැරෙන හන්දියෙන් වමට හරවා කොළඹ නුවර ප්‍රධාන මාර්ගයට ගමන් කර කොළඹ දෙසට ගමන් කළ හැකිය.

- ✓ වේයන්ගොඩ සිට මල්ලැහැව හන්දියෙන් මීරිගම නගරය හරහා හෝ අධිවේගී මාර්ගයට පිවිසෙන රථවාහන මල්ලැහැව හන්දියෙන් දකුණට හරවා පස්යාල හන්දියෙන් නුවර - කොළඹ ප්‍රධාන මාර්ගයේ දංඕවිට හන්දියෙන් වමට හරවා මීරිගම දංඕවිට හන්දියෙන් දකුණට හරවා අධිවේගි පිවිසුමට ගමන් කල හැකිය.

මේ සම්බන්ධයෙන් මහජනතාව හා රියැදුරන් දැනුවත් කිරීම සඳහා ඔබ මාධ්‍ය ආයතන මගින් අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**